මෙම අල් කුර්ආනයට හැඩ ගැසී පිළිපදින්න. මුහම්මද්ගේ ආත්මය කවුරුන් සන්තකයේ ඇත්තේ ද ඔහු මත දිවුරා පවසමි. (ලණුවක) ගැට ගසා ඇති ඔටුවා උගේ ගැටයෙන් පළා යන වේගයට වඩා අල් කුර්ආනය ඉවත්ව යෑම ඉතා වේගත්ය

නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණන් ප්රකාශ කළ බව අබූ මූසා අල්-අෂ්අරී (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී. "මෙම අල් කුර්ආනයට හැඩ ගැසී පිළිපදින්න. මුහම්මද්ගේ ආත්මය කවුරුන් සන්තකයේ ඇත්තේ ද ඔහු මත දිවුරා පවසමි.
(ලණුවක) ගැට ගසා ඇති ඔටුවා උගේ ගැටයෙන් පළා යන වේගයට වඩා අල් කුර්ආනය ඉවත්ව යෑම ඉතා වේගත්ය."
[صحيح] [متفق عليه]

අල් කුර්ආනය තම සිත තුළ තැන්පත් කර ගත් අයකු එසේ තැන්පත් කළ පසුව එය අමතක නොවන පරිදි කියවීමෙහි නිරත වීමත් ඒ අනුව හැඩගැසී එය පිළිපැදීමත් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ නියෝග කළහ. සැබැවින්ම සිත් තුළ රඳවා ඇති අල් කුර්ආනය බැඳ දමන ලද ඔටුවකු පළා යෑමට වඩා වේගයෙන් වෙන් වී පහ ව යනු ඇතැයි නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමාණෝ දිවුරා සිටීමෙන් එය සහතික කළහ. ඌ ගාත මධ්යයේ ලණුවකින් බැඳ දැමූ ඔටුවෙකි. මිනිසා ඌව රැකබලා ගත්තේ නම්, ඌ රැඳී සිටිනු ඇත. ඌ අත්හැර දැමුවේ නම්, ඌ ඉවත් ව ගොස් අතුරුදහන් වනු ඇත.

http://www.sunnah.global/hadeeth/si/show/5907